# නිවේදනය

**<u>ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2162 හා 2020.02.07 දිනැති, අංක 2199 හා 2020.10.23 දිනැති අංක 2200 හා 2020.10.29 දිනැති, අංක 2205 හා 2020.12.04 දිනැති ගැසට් නිවේදන අනුව පවත්වනු ලැබූ සීමිත තරඟ විභාගය හා ව්‍යුහගත හා ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ඇමුණුමෙහි හි නම් සඳහන් නිලධාරීන් 11 දෙනා සඳහා 2025.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණිය සඳහා සීමිත පදනමින් බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බව එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක ESC/APP/SLTES/01/86/2019(IV) හා 2025.08.220දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත.

02. ඒ අනුව පත්වීම් ප්‍රදානය කිරීමේ උත්සවය 2025.09.01 වන සඳුදා දින පෙ.ව 08.30 ට ඉසුරුපාය , අධ්‍යාපන අමාත්‍යාංශයේදී පැවැත්වේ. ඒ සඳහා මෙම ලිපිය සහ ජාතික හැඳුනුම්පත අනිවාර්යයෙන් රැගෙන ආ යුතුය.

03. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධාන අනුව ඔබගේ පත්වීමට අදාළව සුදුසුකම් පරීක්ෂා කිරීමේ දිනය වන 2020.11.06 දින සිට මේ දක්වා විනයානුකූලව දඬුවමක් ලබා තිබේද/ චෝදනා පත්‍රයක් නිකුත් කර තිබේද යන්න තහවුරු වන ලේඛනයක් ඇමුණුම 01 පරිදි ඔබගේ ආයතන ප්‍රධානියා වෙතින් පත්වීම් ලිපි ප්‍රදානය සිදු කරන දිනට රැගෙන ඒම අනිවාර්යය වේ. මෙම ලිපිය ඉදිරිපත් නොකරන නිලධාරීන් සඳහා අදාළ තහවුරු ලිපිය ඉදිරිපත් කරන තෙක් පත්වීම් ලිපි ප්‍රදානය කිරීමට හැකියාවක් නොමැති බව දන්වා සිටිමි.